# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල්

**මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන ඇතැම් සේවානියුක්ත පන්තිවල ප්‍රයෝජනය සඳහා සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීමටත් සහ ඒ හා සම්බන්ධ වූ හා එයට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් පනවනු ලබන පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2011 අප්‍රේල් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 මාර්තු මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[98 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 23.00 යි** **තැපැල් ගාස්තුව : රු. 7.50 යි.**

# සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල්

එල්.ඩී.—ඕ. 24/2011.

**මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන ඇතැම් සේවානියුක්ත පන්තිවල ප්‍රයෝජනය සඳහා සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීමටත් සහ ඒ හා සම්බන්ධ වූ හා එයට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් පනවනු ලබන පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 2011 අංක   දරන සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පිහිටුවීම සහ මේ පනත ක්‍රියාවේ යෙදවීම

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පිහිටුවීම.

**2.** (1) මේ පනතෙහි කාර්යයන් සඳහා (මින් මතු මේ පනතෙහි “අරමුදල” යයි සඳහන් කෙරෙන) සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) (අ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ වාර්ෂික ලාභයෙන් සියයට දහයක් ;

(ආ) වයස අවුරුදු හැත්තෑව ඉක්මවූ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ අක්‍රීය තත්ත්වයේ පවතින ගිණුම්වල මුදල් ; සහ

(ඇ) දීර්ඝ කාලීන කල්පිරීමේ කාලසීමාවක් සහිත රුපියල් මිලියන එක් දහසක් සඳහා වන රජයේ බැඳුම්කරයක්,

අරමුදලට ගෙවිය යුතු ය.

අරමුදලෙහි සාමාජිකත්වය.

**3.** (1) 12 වන හා 13 වන වගන්තිය යටතෙහි අරමුදලට දායක මුදල් ගෙවීමට සේවානියුක්තයකු පළමුවෙන් යටත්වෙන අවස්ථාවක, ඔහු අරමුදලෙහි සාමාජිකයකු බවට පත්විය යුතු අතර, අරමුදලෙහි ඔහුගේ පුද්ගලික ගිණුමේ යම් මුදලක් ඔහුගේ නමින් පවතින තෙක් ඔහු සාමාජිකයකු වශයෙන් සිටිය යුතු ය.

2—PL 005692—1,000 (2011/04)

(2) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ යම් නියෝගයක බලය පිට මිස අරමුදලෙහි සාමාජිකයකුට හෝ ඔහු යටතෙහි ඉල්ලුම් කරන යම් තැනැත්තකුට අරමුදලෙහි මුදල්වලට යම් සම්බන්ධතාවයක් හෝ හිමිකමක් නොතිබිය යුතු ය.

**මේ පනත ක්‍රියාවේ යෙදවීම.**

**4.** (1) මේ පනතෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති විට දී හැර, කම්කරු කොමසාරිස්වරයා මේ පනත සාමාන්‍යයෙන් ක්‍රියාවේ යෙදවීම භාරව සිටිය යුතු ය.

(2) කම්කරු කොමසාරිස්වරයාගේ යම් සාමාන්‍ය හෝ විශේෂ නියමවලට යටත්ව, යම් කම්කරු නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ යම් සහකාර කම්කරු කොමසාරිස්වරයකු විසින් මේ පනත යටතෙහි හෝ මේ පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතෙහි කොමසාරිස්වරයාගේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

(3) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් ඇතුළු නිලධාරීන් යම් සංඛ්‍යාවක් පත් කළ හැකි ය.

(4) මේ පනත යටතෙහි හෝ යම් නියෝගයක් යටතෙහි කොමසාරිස්වරයාගේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට මේ වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතෙහි යම් නිලධරයකුට කම්කරු කොමසාරිස්වරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පැවරිය හැකි ය.

**අරමුදල සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයෙහි බලතල හා කාර්ය.**

**5.** (1) මුදල් මණ්ඩලය විසින්—

(අ) මේ පනත යටතෙහි ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවානියුක්තයන් පත් කළ හැකි ය. ඒ නිලධරයන්ගේ හා සේවානියුක්තයන්ගේ වැටුප් හා වේතන ද නියම කළ හැකි ය. ඔවුන්ගේ සේවා කොන්දේසි ද නිශ්චය කළ හැකි ය ;

(ආ) දායක මුදල්, අධිභාර සහ ගාස්තු වශයෙන් මේ පනත යටතෙහි ගෙවනු ලැබූ සියලු මුදල් හා අරමුදලෙහි මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම භාර ගෙන ඒ මුදල හා ආදායම අරමුදලට බැර කළ යුතු ය ;

(ඇ) ස්වකීය සේවායෝජකයන් විසින් අරමුදලට ගෙවනු ලැබිය යුතු දායක මුදල් එසේ ගෙවිය යුතු දිනයේ දී ගෙවීම ඔවුන් පැහැර හැරීම නිසා පාඩු වන සාමාජිකයන් අතර 18 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිභාරයක් ලෙස ලබා ගත් මුදල්වලින් බෙදනු ලැබිය යුතු අධිභාරයේ ප්‍රමාණය අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය ;

(ඈ) අරමුදලෙහි මුදල්වල භාරය දැරිය යුතු ය ;

(ඉ) කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ තැනැත්තන්හට මේ පනත යටතෙහි හිමි ප්‍රතිලාභ ගෙවිය යුතු ය ;

(ඊ) මුදල්වලින් තුනෙන් දෙකකට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම තහවුරු කරමින් මේ පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලෙහි මුදල්, මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන යම් සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකි ය ;

(උ) අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් ද අරමුදලෙහි එක් එක් සාමාජිකයකු සම්බන්ධයෙන් (මේ පනතෙහි පුද්ගලික ගිණුම් යයි සඳහන් කරනු ලබන) වෙනම ගිණුමක් ද පවත්වාගෙන යා යුතු ය ;

(ඌ) 6 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණාවන් සඳහා අවිනිශ්චිත ගිණුමක් පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය ;

(එ) හැම අවුරුද්දක ම දෙසැම්බර් මස තිස් එක් වන දින අරමුදල සම්බන්ධ ගණන් පොත් තුලනය කරවිය යුතු ය ;

(ඒ) එක් එක් අවුරුද්දක් සඳහා අරමුදල සම්බන්ධයෙන් ලැබීම් හා ගෙවීම් විස්තරයක් ද, අයවැය විස්තරයක් ද, වත්කම් හා බැඳීම් විස්තරයක් ද එක් එක් තැන්පත් යෙදවීමක ප්‍රකාශක අගය, ගැනුම් මිල හා වෙළඳ පොළේ මිල පෙන්නුම් කරන තැන්පත් යෙදවීම් විස්තරයක් ද සකස් කරවිය යුතු ය ;

(ඔ) ඉහතින් වූ (ඒ) ඡේදය යටතෙහි එක් එක් අවුරුද්දක් සඳහා සකස් කරන ලද එක් එක් විස්තරයක පිටපතක් ඒ අවුරුද්දෙහි දෙසැම්බර් මස තිස් එක් වන දිනට පසු තුන් මසක් ඇතුළත අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය ;

(ඕ) එක් එක් අවුරුද්දෙහි ම දෙසැම්බර් මස තිස් එක් වන දිනට පසු හය මසක් ඇතුළත, අරමුදලෙහි එක් එක් සාමාජිකයකුට එදිනට ඔහුගේ පුද්ගලික ගිණුමෙහි නිශ්චිත සහ ප්‍රතිශේධ ශේෂය තිබෙන ප්‍රමාණය දැනුම් දිය යුතු ය ;

(ක) අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් මේ පනත යටතේ මණ්ඩලය සහ කොමසාරිස්වරයා සතු කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය සහ කොමසාරිස්වරයා විසින් දරනු ලබන වියදම් අඩු කළ යුතු ය ;

(ග) යම් යම් හදිසි අවස්ථා හෝ අරමුදලේ වත්කම්වල වෙළඳපල අගය යම් ක්ෂයවීමක් සඳහා මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වූ සංචිත, අරමුදලේ ආදායමෙන් ඇති කළ හැකි ය ;

(ච) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවකින් මණ්ඩලය වෙත පැවරිය හැකි හෝ නියම කළ හැකි අරමුදල සම්බන්ධ වෙනත් බලතල හා කාර්ය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද සෑම නිලධරයකු හෝ සේවානියුක්තයකු ම මුදල් නීති පනත යටතේ කාර්යය ඉටු කිරීම සඳහා සේවයේ නියුක්ත කරනු ලැබූ ලෙස, එකී පනතේ නිලධරයන්ට හා සේවානියුක්තයන්ට අදාළ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා සැලකිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ක) ඡේදයේ කාර්ය සඳහා "වියදම්" යන්නට—

(i) සොරකම් කිරීම, අයථා පරිහරණය හෝ වැඩියෙන් ගෙවීම නිසා ඇති වූ යම් මුදල් පාඩුවක් ;

(ii) අරමුදලෙහි පරිපාලනයේ දී භාවිතා කරනු ලැබූ හෝ ඒ සඳහා මිලදී ගත් හෝ ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හෝ ලිපි ද්‍රව්‍ය නැති වී ඒවායේ වියදම එම නැතිවීමට වගකිවයුතු තැනැත්තන්ගෙන් අයකර ගත නොහැකි වූ විට ; සහ

(iii) ප්‍රයෝජනයට ගත නොහැකි හේතුව මත ලියා අස්කරන ලද ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හෝ ලිපි ද්‍රව්‍යවල වටිනාකම ඇතුළත් විය යුතු ය.

මුදල් මණ්ඩලයෙහි අවිනිශ්චිත ගිණුම.

**6.** (1) (අ) සේවායෝජකයන් විසින් මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග අනුව අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ ; හෝ

(ආ) සපයන ලද වාර්තා ඌණතා සහිත හෝ සාවද්‍ය වාර්තා වීම හේතුවෙන් පුද්ගලික ගිණුම්වලට බැර කළ නොහැකි වූ,

මේ පනත යටතේ ලැබුණු දායක මුදල්, මුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන අවිනිශ්චිත ගිණුමට බැර කළ යුතු ය.

(2) අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට අයත් ඉහත නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යම් මුදල්, මුදල් මණ්ඩලය විසින් අවිනිශ්චිත ගිණුමට පැවරිය යුතු ය.

(3) ඉහත සඳහන් පරිදි අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ සේවායෝජකයකු විසින්, ඔහුගේ සේවානියුක්තයා සම්බන්ධයෙන් නිවැරදි වාර්තා සපයනු ලබන විට, මුදල් මණ්ඩලය විසින් අවිනිශ්චිත ගිණුමෙහි පවත්නා මුදල් සාමාජිකයාගේ පුද්ගලික ගිණුමට පැවරිය යුතු ය.

(4) මෙම ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි අවිනිශ්චිත ගිණුමෙන් පෞද්ගලික ගිණුමකට මුදල් කිසිවක් පවරනු ලබන අවස්ථාවක එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලසීමාවක් නොඉක්මවන පරිදි, එම මුදල් ලැබුණු දින සිට එම මුදල් පෞද්ගලික ගිණුමට පවරනු ලබන දින දක්වා වූ කාලසීමාව සඳහා එම මුදලට පොළියක් ගෙවිය යුතු අතර, පොලී අනුපාතය මේ පනතේ 16(1) වන වගන්තිය අනුව තීරණය කළ යුතු ය. තව ද පොලී අනුපාතය එය ගෙවනු ලබන වර්ෂය සඳහා අදාළ විය යුතු ය.

අරමුදලෙහි ගිණුම් ආදිය විගණකාධිපති විසින් පරීක්ෂා කිරීම.

**7.** (1) එක් එක් අවුරුද්දක් සම්බන්ධයෙන් අරමුදලෙහි ගණන් හිලව් විගණකාධිපති විසින් පරීක්ෂා කළ යුතු ය. විගණනයෙහි ගාස්තු ඔහුට අරමුදලෙන් ගෙවිය යුතු ය. මේ උපවගන්තිය යටතෙහි ඔහුට ගෙවනු ලැබූ සියලු ගෙවීම් ඒකාබද්ධ අරමුදලට එකතු කළ යුතු ය.

(2) විගණකාධිපතිට හෝ අරමුදලෙහි ගණන් හිලව් විගණනය කිරීමට ඔහු විසින් බලය පවරන ලැබූ ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ඒ ගණන් හිලව් විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකාධිපති හෝ ඒ නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබන සියලු පොත් පත් බලා ගැනීමට ඉඩ තැබිය යුතු ය. තව ද මුදල් මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් ඒ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඔවුන් දන්නා හා ඔවුන් විසින් සොයා දැන ගත හැකි තොරතුරු සැපයිය යුතු ය.

(3) විගණකාධිපති විසින් අරමුදලෙහි ගණන් හිලව් විගණනය කොට—

(අ) ඔහුට අවශ්‍ය සියලු තොරතුරු ඔහු විසින් ලබා ගනු ලැබුවේ ද, නැද්ද යන්න සඳහන් කරමින් ද ;

(ආ) අරමුදලෙහි කටයුතු සම්බන්ධ සත්‍ය හා නිවැරදි අදහස් දැක්වෙන පරිදි වාර්තාවෙහි සඳහන් ගණන් හිලව් නිසි ලෙස සකස් කොට තිබේද යන්න සඳහන් කරමින් ද ;

(ඇ) ඒ ගණන් හිලව් සම්බන්ධ යම් පරීක්ෂණයක දී ඔහුගේ මතය අනුව පාර්ලිමේන්තුව සැලකිලිමත් විය හැකි ඒ ගණන් හිලව්වල යම් විෂයකට අවධානය යොමු කරමින් ද,

අමාත්‍යවරයාට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(4) අරමුදලෙහි කිසිදු සාමාජිකයකුගේ නම ඒ වාර්තාවෙන් අනාවරණය නොකළ යුතු ය.

(5) මේ වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතෙහි අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලද විගණකාධිපතිගේ වාර්තාවේ පිටපතක් ද, 5 වන වගන්තියෙහි (ඔ) ඡේදය යටතෙහි මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයා සපයන ලද විස්තරවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු ය.

රජයට ගෙවීම.

**8.** ඒකාබද්ධ අරමුදලෙන් කරනු ලබන සියලුම ගෙවීම්.

(1) අරමුදල පිහිටුවීම සඳහා මූලික වැඩපිළිවෙලවල් සකස් කිරීමේ දී දරන ලද වියදම් පියවීම සඳහා මේ පනත පනවන දිනයට පෙර කොමසාරිස්වරයාට ගෙවන ලද්දා වූ ද,

(2) මේ පනත පනවන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසාන වන කාලසීමාව ඇතුළත මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා මුදල් මණ්ඩලය විසින් සහ කොමසාරිස්වරයා විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුළු සියලු වියදම් පියවීම සඳහා මුදල් මණ්ඩලයට ගෙවන ලද්දා වූ ද,

සෑම මුදලක්ම රජය විසින් මුදල් මණ්ඩලයට දෙන ලද ණයක් විය යුතු අතර, එය මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

පනත ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද වියදම්.

**9.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයා සහ මුදල් මණ්ඩලය විසින් දරනු ලබන වියදම් අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් අයකර ගත යුතු ය. එසේ වුවද මෙම පනතේ IV වන කොටසේ විධිවිධානවල ඇති වියදම් අරමුදලේ ආයෝජනය කර ඇති මුදල්වල ආදායමෙන් ගෙවිය යුතු ය.

## II වන කොටස

### ආවරණය වන වෘත්තීන්, මේ පනත අදාළ වන සේවානියුක්තයන් හා දායක මුදල්

මේ පනත අදාළ වන සේවානියුක්තයන්

**10.** (1) මේ පනතෙහි කාර්ය සඳහා—

(අ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යය සඳහා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද යම් තනතුරක් දරන තැනැත්තන් ; හෝ

(ආ) සේවා ගිවිසුමක් යටතේ සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තන් ඇතුළු 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානයන් ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද "අනුමත යෝජනා ක්‍රමයක හෝ අරමුදලක" සාමාජිකයන් හැර අනෙකුත් සියලු තැනැත්තන් මේ පනත අදාළ වන තැනැත්තන් ලෙස සැලකිය යුතු ය.

(2) ඉහත (අ) හා (ආ) මගින් ආවරණය නොවන සියලු සේවානියුක්තයන්—

(i) මේ පනතේ විධිවිධානයන් ප්‍රකාර විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා හිමිකම් ලැබීමට තවත් වසර දහයකට වඩා තිබෙන යම් වයසක සිටින තැනැත්තකු අරමුදලේ සාමාජිකයන් වශයෙන් සැලකිය යුතු ය ; සහ

(ii) මේ පනතේ විධිවිධානයන් ප්‍රකාර විශ්‍රාම වැටුපක් සඳහා හිමකම් ලැබීමට වසර දහයකට වඩා අඩු කාලයක් තිබෙන යම් වයසක සිටින තැනැත්තකුට අරමුදලේ සාමාජිකයකු බවට පත්වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කිරීමට හිමිකම තිබිය යුතුය.

ආසන්නතම සේවායෝජකයා තවත් අයකු යටතේ සේවයෙහි යෙදී සිටීම.

**11.** යම් තැනැත්තකුගේ ආසන්නතම සේවායෝජකයා තවත් අයකු යටතේ සේවයෙහි යෙදී සිටින අවස්ථාවක හා එම ආසන්නතම සේවායෝජකයා එකී අනෙක් තැනැත්තාගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් හා එහි කාර්යයන් සඳහා කටයුතු කිරීමට සේවයෙහි යොදවනු ලැබූ අවස්ථාවක, මේ පනතෙහි කාර්යයන් සඳහා එකී අනෙක් තැනැත්තා ආසන්නතම සේවායෝජකයාත් සමග පළමුවෙන් සඳහන් කරනු ලැබූ තැනැත්තාගේ සේවායෝජකයා වශයෙන් සැලකිය යුතු ය.

සේවානියුක්තයන්ට අදාළ දායක මුදල්.

**12.** 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ආවරණය වන වෘත්තියක යෙදෙන සියලු සේවානියුක්තයන් අරමුදලට දායක විය යුතු ය. එවැනි සේවා නියුක්තයකුගේ අදාළ දායක මුදල් පහත සඳහන් පරිදි ගෙවිය යුතු ය.

(අ) සේවායෝජකයාගේ දායකත්වය ලෙස සේවානියුක්තයාගේ මාසික දළ වැටුපෙන් සියයට දෙකකට නොඅඩු මුදලකට සාමාන මුදලක් ;

(ආ) සේවානියුක්තයාගේ දායකත්වය ලෙස සේවානියුක්තයාගේ මාසික දළ වැටුපෙන් සියයට දෙකකට නොඅඩු මුදලක් ;

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර යම් සේවානියුක්තයකුට ගෙවිය යුතු පාරිතෝෂික මුදලින් සියයට දහයකට නොඅඩු මුදලක් පාරිතෝෂික ගෙවීම කරන අවස්ථාවේ සේවායෝජකයා විසින් ගෙවීම ; සහ

(ඈ) අර්ථසාධක අරමුදලෙහි යම් සේවානියුක්තයකුගේ පුද්ගලික ගිණුමෙහි තැන්පත් වී ඇති දළ ශේෂයෙන් සියයට දෙකකට නොඅඩු මුදලක් එම අරමුදලෙන් එම සේවානියුක්තයා වෙත ගෙවීම් කරනු ලබන අවස්ථාවේ දී කම්කරු කොමසාරිස්වරයා හෝ වෙනත් යම් බලධරයකු විසින් ගෙවීම ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක යම් සේවානියුක්තයකුගේ බැරට තිබෙන ඉපැයීම්වලින් සියයට දහයක ප්‍රමාණයක්.

13\. (1) 14 වන වගන්තියේ විධිවිධානයන්ට යටත් ව—

1996 ජනවාරි මස 1 වන දිනයෙන් පසුව විශ්‍රාම ප්‍රතිලාභ ලාබාදී නොමැති ආයතනවල සේවානියුක්තන්ට අදාළ දායකත්වය.

(අ) 1996 ජනවාරි මස 1 වන දිනට පෙර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සේවානියුක්තයන් වෙත ගෙවීම් සඳහා විධිවිධාන සලස්වා ඇති ;

(ආ) 1996 ජනවාරි මස 1 වන දිනයෙන් පසු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සේවානියුක්තයන් වෙත ගෙවීම ඉවත් කරනු ලැබ ඇති,

යම් ආයතනයක සේවානියුක්තයකුට, එම සේවානියුක්තයා මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙර නමුත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම ඉවත් කරන ලද දිනයෙන් පසුව එවැනි යම් ආයතනයකට බැඳුන ද මෙම අරමුදල සඳහා දායක වීමට හිමිකම ලැබිය යුතු ය.

(2) එවැනි යම් සේවානියුක්තයකුට අදාළ දායක මුදල්, එම එක් එක් සාමාජිකයා සේවය කර ඇති කාලසීමාව සැලිකිල්ලට ගෙන පහත සඳහන් පරිදි ගෙවිය යුතු ය.

(අ) විශ්‍රාම වැටුප් හිමිකම ඉවත් කළ දින සහ එම සාමාජිකයා අරමුදලෙහි සාමාජිකයකු බවට පත් වූ දිනය දක්වා වන

කාලසීමාව සඳහා සේවායෝජකයාගේ දායකත්වය වශයෙන් සේවානියුක්තයාගේ දළ වැටුපෙන් සියයට පහකට සමාන මුදලක් ගෙවීම, එම මුදල එක් වාරිකයකින් ගෙවිය යුතු ය ;

(ආ) සේවායෝජකයාගේ දායකත්වය වශයෙන් සේවානියුක්තයාගේ මාසික දළ වැටුපෙන් සියයට පහකට සමාන මුදලක් ගෙවීම ;

(ඇ) යම් සේවානියුක්තයකු අරමුදලෙහි සාමාජිකයකු බවට පත්වන දිනයේදී 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතෙහි නියමන්හි ප්‍රකාර එම සේවනියුක්තයා වෙත පාරිතෝෂික වශයෙන් ගෙවිය යුතු සහ අයවිය යුතු සම්පූර්ණ මුදල සේවායෝජකයා විසින් එක් වාරිකයකින් අරමුදල වෙත ගෙවිය යුතු ය. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ නියමයන් ප්‍රකාර පාරිතෝෂික සඳහා හිමිකම් ලබන යම් සේවානියුක්තයකු පසුව අරමුදලේ සාමාජිකයකු බවට පත් වූ විට ඉහත සඳහන් කරනු ලැබ ඇති පනත යටතේ වන පාරිතෝෂික සඳහා වන ඔහුගේ හිමිකම අත්හරිනු ලැබීමට නියම කළ යුතු ය ;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් පසුව යම් සේවානියුක්තයකු වෙත පාරිතෝෂික වශයෙන් ගෙවිය යුතු සහ අයවිය යුතු මුදල එම සේවානියුක්තයාගේ අවසන් වරට ලැබූ වැටුපෙන් අඩ මසක වැටුපට සමාන මුදලක් ඔහු සේවය කරන ලද සෑම වර්ෂයක් වෙනුවෙන් ම ගෙවීම තහවුරු කරමින් වාර්ෂිකව ගෙවිය යුතු ය ;

(ඉ) අර්ථසාධක අරමුදලෙහි යම් සේවානියුක්තයකුගේ පුද්ගලික ගිණුමෙහි තැන්පත් වී ඇති දළ ශේෂයෙන් සියයට පහකට නොඅඩු මුදලක් එම අරමුදලෙන් එම සේවානියුක්තයා වෙත ගෙවීම් කරනු ලබන අවස්ථාවේ දී කම්කරු කොමසාරිස්වරයා හෝ වෙනත් යම් බලධරයකු විසින් ගෙවීම ;

(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිත පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක යම් සේවානියුක්තයකුගේ බැරට තිබෙන ඉපැයීම්වලින් සියයට දහයක ප්‍රමාණයක්.

(3) මේ වගන්තියේ විධිවිධානයන් 2011 මැයි මස 01 වන දින හෝ ඊට පෙර මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ආයතනයක සේවය කරනු ලබන යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් ඊට පටහැනිව එහි කුමක් සඳහන්ව තිබුණ ද අදාළ විය යුතු ය.

දායක මුදල් ගෙවීමේ වගකීම ආරම්භ වීම.

**14.** 12 වන වගන්තිය සහ 13 වන වගන්තිය යටතේ දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් ආවරණය වන වෘත්තියක සේවානියුක්තයකුගේ, ඔහුගේ සේවායෝජකයාගේ සහ කම්කරු කොමසාරිස්වරයාගේ හෝ වෙනත් යම් බලධරයකුගේ වගකීම, අමාත්‍යවරයා විසින් එම වෘත්තිය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරන ලද දිනයට ඉක්බිතිවම වූ දිනයෙහි සිට ආරම්භ විය යුතු ය.

මේ පනත යටතෙහි සේවානියුක්තයා සම්බන්ධයෙන් සේවායෝජකයාගේ දායක මුදල් ප්‍රමාණය අඩු කිරීමේ කාර්යය සඳහා යම් සේවානියුක්තයකුගේ ඉපැයීම් අඩු කළ සේවායෝජකයාට කොමසාරිස්වරයා විසින් කරනු ලබන විධානයන්.

**15.** (1) නියම කරගත් දිනයට පෙරාතුවම අවුරුදු එකක කාලසීමාව තුළ හෝ ඒ දිනයෙහි හෝ ඊට පසු යම් අවස්ථාවක යම් සේවානියුක්තයකුගේ සේවායෝජකයකු විසින් ඒ දායක මුදල් අඩු කිරීමේ කාර්යය සඳහා එවැනි සේවානියුක්තයකුගේ ඉපැයීම අඩු කළ බව කොමසාරිස්වරයාට සෑහීමට පත්විය හැකි පරිදි පෙනී යන්නේ නම්, කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමකින් ඒ සේවානියුක්තයාට එවැනි අඩු ඉපැයීම් ලැබෙන සම්පූර්ණ කාලසීමාව සම්බන්ධයෙන් ඒ කාලය තුළ සේවායෝජකයා විසින් දායක මුදල් වශයෙන් නියම ලෙස ගෙවනු ලැබූ මුදල හා අඩු කිරීමට පෙර ඒ සේවානියුක්තයාගේ ඒ ඉපැයීම පදනම් කොට ඒ දායක මුදල් ගණන් බලන ලද්දේ නම් ඒ කාලය තුළ ඔහු විසින් ගෙවිය යුතුව තිබුණු මුදල අතර වෙනස යම් වාරිකවලින් හා ඒ දැන්වීමෙහි නියම කරන ලද යම් දිනයන්ට පෙර ඒ සේවායෝජකයා විසින් අරමුදලට ගෙවිය යුතු ලෙස විධාන කළ යුතු ය.

(2) මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතෙහි කොමසාරිස්වරයා විසින් යම් සේවායෝජකයකුට විධානයක් කරනු ලැබූ අවස්ථාවක ඒ සේවායෝජකයා විසින් ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

දායක මුදල් ආදිය සම්බන්ධ පොළිය.

**16.** (1) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් අරමුදලෙහි එක් එක් සාමාජිකයාගේ පුද්ගලික ගිණුමෙහි අය පක්ෂයට තිබෙන මුදලින් අරමුදලෙහි තැන්පත් කර ඇති මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් වාර්ෂිකව නියම කළහැකි අවුරුද්දකට සියයට 2.5 කට නොඅඩු පොළියක් මාසිකව පුද්ගලික ගිණුම්වලට බැර කළ යුතු ය.

(2) මේ පනත යටතෙහි අරමුදලට ගෙවනු ලැබූ දායක මුදල් සම්බන්ධයෙන් ගෙවිය යුතු පොළියෙහි යම් කොටසක් ගෙවීම සඳහා අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන අවස්ථාවක එම හිඟය මේ සඳහා පාර්ලිමේන්තුව මගින් වෙන් කරනු ලබන මුදල්වලින් පියවිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතෙහි පාර්ලිමේන්තුව මගින් ලබාදෙනු ලබන යම් මුදලක් රජය මගින් මුදල් මණ්ඩලයට දෙනු ලැබූ ණයක් විය යුතු අතර මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි කොන්දේසි හා නියමයන් අනුව එය ආපසු ගෙවිය යුතු ය.

(4) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ කාර්යය සඳහා මෙම අරමුදල කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප් අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

සේවානියුක්තයන්ගෙන් ලැබිය යුතු දායක මුදල් ගෙවීම.

**17.** (1) මේ පනතට අදාළවන සේවානියුක්තයකුගේ සේවායෝජකයා විසින් මේ පනතේ 11 (1) වගන්තිය යටතට අදාළ එබඳු සේවානියුක්තයකුගේ එක් එක් මාසයක දායක මුදල ඒ සේවානියුක්තයාගේ ඉපැයීම්වලින් අඩු කොට ඊලඟ මාසයෙහි අවසාන දිනයට පෙර අරමුදලට ගෙවිය යුතු ය. එබඳු සේවානියුක්තයකු වෙනුවෙන් එවැනි සේවායෝජකයකු විසින් මේ පනතෙහි 11 (2) වගන්තිය යටතේ අරමුදලට ගෙවනු ලැබූ දායක මුදලක් ඒ සේවානියුක්තයා විසින් අරමුදලට ගෙවනු ලැබූ පරිදි සැලකිය යුතු ය.

(2) මේ පනත අදාළවන යම් සේවානියුක්තයකුගේ සේවායෝජකයා විසින් එම සේවානියුක්තයාගේ යම් මුදලක් අඩුකර අරමුදලට ගෙවනු ලබන විට එම සේවානියුක්තයා වෙනුවෙන් එවැනි සෑම අඩුකිරීමක් සම්බන්ධයෙන් නිසි වාර්තා පවත්වාගෙන යා යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා විසින් එවැනි අඩුකිරීම් නිවැරදි ලෙස කරන ලද බවට තමන් විසින් සෑහීමට පත්වීම පිණිස ඔහු විසින් පරීක්ෂා කිරීම සඳහා යම් වාර්තා ඉදිරිපත් කරන ලෙස යම් සේවායෝජකයකුට නියම කළ හැකිය, එවැනි වාර්තා පවත්වාගෙන යාම පැහැර හැර ඇති යම් සේවායෝජකයකුට එම නොකර හැරීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රකාශයක් කරන ලෙස නියම කළ යුතු ය.

නියමිත දිනට දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙත අධිභාරයක් පැනවීම.

**18.** යම් මාසයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනයට පෙර අරමුදලට නොගෙවනු ලැබූ ද, ඒ දායක මුදල් ගෙවීමට අපොහොසත් වූයේ ඔහුගේ පාලනයෙන් බැහැර නොවැළැක්විය හැකි හේතු නිසා බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි පැහැදිලි කිරීමට සේවා යෝජකයාට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයට අතිරේකව පහත සඳහන් ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරයක් ඒ මුදල සම්බන්ධයෙන් අරමුදලට ගෙවීමට සේවා යෝජකයා බැඳී සිටිය යුතු ය :—

(අ) දින දහයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහක අධිභාරයක් ;

(ආ) දින දහයකට වැඩි වන නමුත් එක් මාසයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහළොවක අධිභාරයක් ;

(ඇ) එක් මාසයකට වැඩි වන නමුත් මාස තුනකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) තුන් මාසයකට වැඩි වන නමුත් හය මාසයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) මාස හයකට වැඩි වන නමුත් මාස දොළහකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට හතළිහක අධිභාරයක් ;

(ඊ) මාස දොළහකට වැඩි කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක අධිභාරයක්.

*දායක මුදල් අයකර ගැනීම.*

**19.** (1) අරමුදලට අයවිය යුතු යම් මුදලක් රජයට අයවිය යුතු ණයක් මෙන්, ලඝු කාර්ය පටිපාටිය අනුව පැවරිය හැකි නඩුවකින් අයකර ගත යුතු ය. ලඝු කාර්ය පටිපාටිය අදාළ වන නඩුවලට සම්බන්ධ සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන මේ වගන්තිය යටතෙහි වන නඩුවකට අදාළ විය යුතු ය. එබඳු නඩුවකට එබඳු විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා පමණක් ඒ සංග්‍රහයෙහි 8 වෙනි වගන්තිය, ඒ වගන්තියෙහි සඳහන් “මේ ආඥාපනතින්” යන වචන වෙනුවට “මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින්” යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් බල පෑ යුතු ය.

(2) කොමසාරිස්වරයා හෝ ඔහු වෙනුවෙන් යම් බලය ලත් නිලධරයකු විසින් අරමුදලට අය විය යුතු යම් මුදල් සම්බන්ධ නීති කටයුතු ඇරඹිය හැකි ය. වෙනත් යම් ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද කොමසාරිස්වරයා හෝ ඒ නිලධරයා විසින් ඒ නීති කටයුතු පවත්වාගෙන ගෙන යා හැකි ය.

(3) මේ පනත යටතේ අධිභාර ගෙවීම් හෝ දායක මුදල් වශයෙන් ගෙවිය යුතු යම් මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් කාලාවරෝධ ආඥා පනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

*සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කළ යුතු මුදල්.*

**20.** අරමුදලෙහි සාමාජිකයකුගේ ද ඔහු සම්බන්ධයෙන් සේවා යෝජකයාගේ ද දායක මුදල් හා ඒ දායක මුදල් සම්බන්ධ පොලිය ද මුදල් මණ්ඩලය විසින් ඒ සාමාජිකයාගේ පුද්ගලික ගිණුමට බැර කළ යුතු ය.

*සේවා යෝජකයා විසින් තමාගේ සේවානියුක්තයන්ගේ ඉපයීම් අඩු කිරීම ආදිය තහනම් කිරීම.*

**21.** සේවානියුක්තයකු සම්බන්ධයෙන්, මේ පනත යටතෙහි යම් දායක මුදලක් හෝ යම් අධිභාරයක් සේවායෝජකයකු විසින් ගෙවීමට බැඳී සිටීමේ හේතුවෙන් කිසිම සේවායෝජකයකු විසින් ඒ සේවානියුක්තයාගේ ඉපයීම් අඩු කිරීම හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතෙහි හෝ ඒ සේවායෝජකයා සමග ඔහුගේ සේවා ගිවිසුම යටතෙහි ඔහුට හිමි යම් ප්‍රතිලාභ ඔහුට හානි වන පරිදි වෙනස් කිරීම නොකළ යුතු ය.

**22.** මේ පනත යටතෙහි දායක මුදලක් හෝ අධිභාරයක් වශයෙන් සේවායෝජකයකු විසින් ගෙවීමට බැඳී සිටින යම් මුදලක් යම් සේවානියුක්තයකුගේ සේවායෝජකයා විසින් ඒ සේවානියුක්තයාගේ ඉපයීම්වලින් අඩු නොකළ යුතු ය. මේ පනත යටතෙහි ඒ සේවායෝජකයාගේ බැඳීමෙහි යම් කොටසක් ඒ සේවානියුක්තයාට පැවරුම් කරමින් ඒ සේවායෝජකයා ඒ සේවානියුක්තයා සමග ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් ශූන්‍ය සහ අවලංගු විය යුතු ය.

මේ පනත යටතෙහි සේවානියුක්තයකු සම්බන්ධයෙන් සේවා යෝජකගෙන් අය විය යුතු ගෙවීම් සේවානියුක්තයාගේ ඉපයීම්වලින් සේවායෝජකයා විසින් අඩු කර ගැනීම තහනම්ය.

**23.** මේ පනත යටතේ සේවායෝජකයකු විසින් මුදලක් ගෙවිය යුතු යයි නියමිත කාලසීමාව අවසාන වීමෙන් පසු ඊට ඉක්බිතිව ම වූ දිනයෙහි, මේ පනත යටතෙහි සේවායෝජකයකුගෙන් අය විය යුතු යම් මුදලක් වෙනත් යම් ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද ඔහුගේ වත්කම් සම්බන්ධයෙන් පළමු වෙනි අය කිරීම විය යුතු ය.

මේ පනත යටතෙහි සේවා යෝජකයකුගෙන් අය විය යුතු මුදල ඔහුගේ වත්කම් සම්බන්ධයෙන් පළමු වෙනි අය කිරීම විය යුතු ය.

**24.** අරමුදලෙහි සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙහි අය පක්ෂයට ඇති යම් මුදලක් සම්බන්ධ සෑම පැවරීමක් හෝ අය කිරීමක් හා එවැනි මුදලක් පැවරීම හෝ අය කිරීම සම්බන්ධ සෑම ගිවිසුමක් ශූන්‍ය විය යුතු ය. බලයලත් අධිකරණයක් විසින් ඒ සාමාජිකයා වස්තුභංගත්වයට පත් වූ තැනැත්තකු වශයෙන් තීරණය කරනු ලැබූ අවස්ථාවක, වස්තුභංගත්ව ආඥා පනතෙහි විධිවිධාන කුමක් වුව ද ඒ සාමාජිකයාගේ ණය හිමියන් වෙනුවෙන් ක්‍රියා කරන කිසිම පැවරුම්ලාභියකුට එබඳු යම් මුදලක් නොලැබිය යුතු ය.

පෞද්ගලික ගිණුම්වල අය පක්ෂයට ඇති මුදල් අන්සතු කළ නොහැකි බව.

## III වන කොටස

## විශ්‍රාම ප්‍රතිලාභ

**25.** (1) (3) වන හා (4) වන උපවගන්තිවලට යටත්ව, 12 වන වගන්තිය යටතේ ආවරණය වන අරමුදලේ යම් සාමාජිකයකුට එම සාමාජිකයා වයස අවුරුදු හැට සම්පූර්ණවීම මත පහත ආකාරයට ගණනය කරනු ලබන අවම මාසික විශ්‍රාම වැටුපක් ගෙවිය යුතු ය :—

සේවානියුක්තයන් හට විශ්‍රාම වැටුප ගෙවනු ලබන අවස්ථාව සහ දායක මුදල් ගෙවිය යුතු කාලසීමාව.

(අ) යම් සාමාජිකයකුට වසර දහයකට වැඩි සහ වසර දහනවයකට නොවැඩි සේවා කාලයක් තිබෙන විට අදාළ සේවානියුක්තයාගේ වැටුපෙන් සියයට පහළොවකට සමාන දළ සාමාන්‍ය අගය මත ගණනය කරන ලද යම් මුදලක් ;

(ආ) යම් සාමාජිකයකුට වසර විස්සකට නොඅඩු සහ වසර විසිනවයකට නොවැඩි සේවා කාලයක් තිබෙන විට අදාළ සේවානියුක්තයාගේ වැටුපෙන් සියයට තිහකට සමාන දළ සාමාන්‍ය අගය මත ගණනය කරන ලද යම් මුදලක් ;

(ඇ) යම් සාමාජිකයකුට වසර තිහක් හෝ ඊට වැඩි සේවා කාලයක් තිබෙන විට අදාළ සේවානියුක්තයාගේ වැටුපෙන් සියයට හැටකට සමාන දළ සාමාන්‍ය අගය මත ගණනය කරන ලද යම් මුදලක්,

(2) 4 වන උපවගන්තියට යටත්ව, 13 වන වගන්තිය යටතේ ආවරණය වන අරමුදලේ යම් සාමාජිකයකුට එම සාමාජිකයා වයස අවුරුදු හැට (60) සම්පූර්ණවීම මත පහත ආකාරයට ගණනය කරනු ලබන අවම මාසික විශ්‍රාම වැටුපක් ගෙවිය යුතු ය :—

(i) යම් සාමාජිකයකුට වසර විස්සකට නොඅඩු සේවා කාලයක් තිබෙන විට, අදාළ සේවා නියුක්තයා අවසන් වරට ලබාගත් වැටුපෙන් සියයට තිහකට සමාන මුදලක් ;

( ii ) යම් සාමාජිකයකුට එයට වඩා වැඩි සේවා කාලයක් තිබෙන විට, එම වැඩිවන සෑම වසරක් සඳහාම අමතර සියයට දෙකක් සඳහා ඔහු හිමිකම් ලබයි :

එසේ වුව ද, මෙම වගන්තියට අනුව ගණනය කිරීමේ පදනම සඳහා ඕනෑම එක් වසරක් සඳහා ගණනය කරනු ලබන උපරිම වැටුප් වැඩිවීම ඊට පෙර වර්ෂයේ වැටුපෙන් සියයට හයයි දශම පහක් නොඉක්මවිය යුතු ය.

(3) යම් සාමාජිකයකු වයස අවුරුදු හැට සම්පූර්ණ වීමට පෙර ඔහු විසින් දායක මුදල් ගෙවිය යුතු කාලසීමාව තුළ 12 වන වගන්තියේ නියම කර ඇති පරිදි අදාළ වසර සංඛ්‍යාව එම සාමාජිකයාට නොමැති අවස්ථාවක දී, සාමාජිකයා විසින් එම අදාළ කාලසීමාව සම්බන්ධයෙන් හිග ගෙවීම්, අරමුදල විසින් අනුමත කරනු ලැබිය හැකි වාරිකවලින් ගෙවනු ලැබිය හැකි ය.

(4) අදාළ සාමාජිකයකු ජීවත්ව සිටින බවට තහවුරු කිරීමක් අවම වශයෙන් වාර්ෂිකව අදාළ දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම නිලධාරි විසින් සිදු කළ යුතු බවට කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කළ යුතු ය. ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ රටවල් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් එය තහවුරු කරගත යුතු ය. යම් සාමාජිකයකු මිය ගොස් ඇති බව එම තහවුරු කිරීමේ දී වාර්තා වුවහොත්, ඔහුගේ නම කපා හැරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.

ඇතැම් අවස්ථාවල තැනැත්තන්ට එක්වර ගෙවීම් සිදුකිරීමට ඇති බලතල.

**26.** (1) යම් සාමාජිකයකු -

(අ) මේ පනතෙන් නියම කර ඇති දායක මුදල් ගෙවා විශ්‍රාම වැටුපක් ලැබීමට පෙර ; හෝ

(ආ) මේ පනත යටතේ නියම කර ඇති දායක මුදල් ගෙවීම සම්පූර්ණ නොකර විශ්‍රාම වැටුපක් ලැබීමට පෙර,

අවුරුදු 18 ට අඩු දරුවකු හෝ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කර ඇති අංගවිකල හෝ මන්ද බුද්ධික එනම් තම ජීවිකාව ගෙන යාමට ඉපැයීමක් කිරීමට නොහැකි යම් දරුවකු තබා මියගිය හොත් එම යැපෙන්නාට සාමාජිකයාගේ පුද්ගලික ගිණුමෙහි අය පක්ෂයට තිබෙන මුදලින් සියයට හැටකට සමාන මුදලක් එකවර ගෙවිය යුතු ය. එක් යැපෙන්නෙකුට වැඩි සංඛ්‍යාවක් සිටී නම්, එම මුදල එම යැපෙන්නන් අතර සමානව බෙදිය යුතු ය.

(2) ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කර ඇති පරිදි ස්ථිර නොහැකියාවකට පත්වීම හේතුවෙන් සිය සේවය අවසන් කිරීමට සිදු වූ සේවානියුක්තයෙකුට මෙම පනත යටතේ දායක මුදල් ගෙවීම සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් එම සාමාජිකයාගේ පුද්ගලික ගිණුමෙහි තිබෙන මුදලින් සියයට හැටකට සමාන මුදලක් එම සාමාජිකයාට ගෙවිය යුතු ය.

විශ්‍රාම වැටුපක් ලබාගැනීම සඳහා ඉල්ලීම.

**27.** මේ පනත යටතෙහි විශ්‍රාම වැටුපක් සඳහා යම් තැනැත්තකුගේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඔහු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් නියමිත අන්දමට ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීම ඒ සඳහා වන කොන්දේසියක් විය යුතු ය.

## IV වන කොටස

## ඉල්ලීම් පිළිබඳව තීරණය කිරීම

කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් ඉල්ලීම් පිළිබඳ තීරණය කිරීම.

**28.** විශ්‍රාම වැටුප් සම්බන්ධ සියලු ඉල්ලීම් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් තීරණය කළ යුතු ය. කොමසාරිස්වරයාගේ හෝ ඒ නිලධරයාගේ තීරණය මේ පනතෙහි විධිවිධාන අනුව එබඳු තීරණයකට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් සම්බන්ධ යම් තීර්ණයකට යටත්ව අවසාන තීරණයක් විය යුතු ය.

එසේ වුව ද, මේ වගන්තිය යටතෙහි යම් නිලධරයකු විසින් ලබාදන ලද යම් තීරණයක් කොමසාරිස්වරයා විසින් ස්වකීය යෝජනාව පිට නියමිත කාල සීමාව තුළ නැවත සලකා බැලිය හැකි ය. එවැනි අවස්ථාවක කොමසාරිස්වරයාගේ තීරණය 29 වෙනි වගන්තියෙහි කාර්ය සඳහා, ඒ කාරණය සම්බන්ධ තීරණය වශයෙන් සැලකිය යුතු ය.

අභියාචනා.

**29.** (1) 28 වන වගන්තිය යටතේ ලබාදෙනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව (මින්මතු මේ පනතෙහි "විනිශ්චය සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඒ හා අදාළ පළපුරුද්දක් සහිත පස්දෙනෙකුට නොඅඩු සහ දසදෙනෙකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත අභියාචනා විනිශ්චය සභාවක් වෙත අභියාචනා කල හැකි අතර එවැනි අභියාචනයක් පිළිබඳ විනිශ්චය සභාවේ තීරණය, එබඳු තීරණයකට විරුද්ධව කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය මගින් කළ හැකි යම් ආඥාවකට යටත්ව අවසානාත්මක විය යුතු ය.

(2) කොමසාරිස්වරයා හෝ විනිශ්චය සභාවට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ යම් පාර්ශ්වයක් ඒ අභියාචනය පිළිබඳ විනිශ්චය සභාවෙහි තීරණය සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අවස්ථාවක, කොමසාරිස්වරයා හෝ ඒ පාර්ශ්වය විසින්, අභියාචනයට සම්බන්ධ අනෙක් සෑම පාර්ශ්වයක්ම වගඋත්තරකරුවකු වශයෙන් සඳහන් කරනු ලැබූ ලිඛිත පෙත්සමක මාර්ගයෙන්, ඒ තීරණයට විරුද්ධව නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනය කළ හැකි ය. විවාද කළ යුතු නීති ප්‍රශ්නය අභියාචනා පෙත්සමෙහි දැක්විය යුතු ය. ඒ ප්‍රශ්නය අභියාචනාධිකරණය මගින් විනිශ්චය කිරීම සුදුසු බවට නීතිඥයකුගෙන් සහතිකයක් ද ඒ සමග තිබිය යුතු ය. යම් තීරණයකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවේ ද විනිශ්චය සභාවේ ඒ තීරණයෙහි දිනයට පසු, දින විසි එකක් තුළ අභියාචක විසින් පෙත්සම විනිශ්චය සභාවට ඉදිරිපත් කළ යුතු ය. වගඋත්තරකරුවන් වශයෙන් සඳහන් කරනු ලැබූ එක් එක් තැනැත්තකුට භාර දීම සඳහා ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් ඒ සමග එවිය යුතු ය. එවැනි එක් එක් අභියාචනා පෙත්සමක් නියමිත ගාස්තුව සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියෙහි නියම කර ඇති ආකාරයට හා කාලය තුළ විනිශ්චය සභාවට අභියාචනා පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක :—

(අ) යම් තීරණයකට විරුද්ධව පෙත්සම ඉදිරිපත් කරන ලද්දේ ද විනිශ්චය සභාව මගින් කල ඒ තීරණයෙහි නීති කටයුතුවල වාර්තාවක් සමග පෙත්සම අභියාචනාධිකරණයට ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්වීම; හා

(ආ) අභියාචනා පෙත්සමෙහි නම් කරන ලද එක් එක් වගඋත්තරකරුවකුට අභියාචනය සම්බන්ධ දැන්වීම හා අභියාචනා පෙත්සමෙහි පිටපතක් භාර දෙනු ලැබීමට සැලැස්වීම,

විනිශ්චය සභාවෙහි කාර්යය විය යුතු ය.

(4) මේ වගන්තිය යටතෙහි අභියාචනාධිකරණයට ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම ඒ අධිකරණයෙහි යම් විනිශ්චයකාරවරුන් දෙදෙනකු විසින් විමසා තීරණය කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතෙහි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය තීරණයක් දීමෙන් පසු, ඒ අධිකරණයෙහි රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අධිකරණ තීරණය සමග එම නඩුව විනිශ්චය සභාවට එවිය යුතු ය. එවිට ඒ අධිකරණ තීරණයෙන් නියම කරනු ලබයි නම්, අභියාචනය කරනු ලැබූ විනිශ්චය සභාවෙහි ඒ තීරණය, අධිකරණ තීරණයෙන් නියම කර ඇති ආකාරයට විනිශ්චය සභාව විසින් අවලංගු කිරීම හෝ වෙනස් කිරීම ද ඒ අධිකරණ තීරණය ක්‍රියාත්මක කිරීමෙහි කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ අවස්ථාවක අලුත් තීරණයක් කිරීම ද විනිශ්චය සභාවෙහි කාර්යය විය යුතු ය.

(6) මේ වගන්තිය යටතෙහි අභියාචනාධිකරණයට කරනු ලැබූ යම් අභියාචනයක ගාස්තු සම්බන්ධයෙන් ඒ අධිකරණයට සුදුසු යයි හැඟෙන අන්දමේ ආඥාවක් ඒ අධිකරණය මගින් ලබාදිය හැකි ය.

(7) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යයි මේ වගන්තියෙහි (6) වන උපවගන්තිය යටතෙහි අභියාචනාධිකරණය මගින් නියම කරනු ලැබූ යම් ගාස්තු, මහෙස්ත්‍රාත් අධිකරණයෙහි සාමාන්‍ය අධිකරණ

බලය ක්‍රියාවෙහි යෙදවීමේ දී ඒ අධිකරණය මගින් නියම කළ හැකි දඩ මුදල් ප්‍රමාණය නොතකා එම මහෙස්ත්‍රාත් අධිකරණය මගින් නියම කරනු ලැබූ දඩයක් මෙන්, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ තැනැත්තා පදිංචි ස්ථානයෙහි අධිකරණ බලය දරන මහෙස්ත්‍රාත් අධිකරණයට ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර අයකර ගත හැකි ය.

(8) මේ පනත යටතෙහි සාදනු ලැබූ යම් නියෝගවලට යටත්ව විනිශ්චය සභාව විසින් එහි කටයුතු විධිමත් කළ හැකි ය.

*විනිශ්චය සභාවෙහි සාමාජිකයන් හට පාරිශ්‍රමික ගෙවීම.*

**30.** මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි යම් පාරිශ්‍රමික විනිශ්චය සභාවෙහි සාමාජිකයන්ට ගෙවිය හැකි ය.

## V වන කොටස

### සාමාන්‍ය කරුනු

*උපදේශක කමිටුව.*

**31.** කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ද, කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගෙන් ද, සේවා යෝජකයන් අතරෙන් එක් සමාජිකයෙකු ද, සේවා නියුක්තිකයන් අතරින් අනෙක් සාමාජිකයා ද නියෝජනය වන පරිදි කම්කරු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තවත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද සමන්විත වන උපදේශක කමිටුවක් පිහිටවනු ලැබිය යුතු ය. මුදල් මණ්ඩලය විසින් කලින් කලට, අරමුදලේ ක්‍රියාත්මක වීම පිළිබඳ උපදේශක කමිටුව විමසනු ලැබිය යුතු ය.

*වාර්තා ආදිය ගෙන්වා ගැනීමට කොමසාරිස්වරයා සතු බලතල.*

**32.** (1) මේ පනතෙහි කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින්—

(අ) ඔහු විසින් නියම කළ හැකි යම් විස්තර ඇතුළත් වාර්තාවක් ද;

(ආ) එසේ සපයන ලද ඕනෑම වාර්තාවක සඳහන් කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් ඔහු විසින් කරනු ලැබිය හැකි යම් පැහැදිලි කිරීමක් ද;

නියමිත දිනයකට පෙර තමා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට ලිඛිතව විධාන කළ හැකි ය. ඒ තැනැත්තා ඒ විධානය ඉටු කල යුතු ය. ගැසට් පත්‍රයෙහි හා ශ්‍රී ලංකාවෙහි සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර දෙකක හෝ වැඩි ගණනක දැන්වීමක් ප්‍රසිද්ධ කිරීමෙන් මේ උපවගන්තියෙහි පෙරාතුව සඳහන් විධිවිධාන යටතෙහි විධානයක් කළ හැකි ය.

(2) මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතෙහි ලේඛනයක් සපයන යම් තැනැත්තකු විසින් ඒ ලේඛනයෙහි අන්තර්ගත කරුණු රහසිගත ලෙස සැළැකිය යුතු බවට ලිඛිත ඉල්ලීමක් ඒ ලේඛනයත් සමග එවිය හැකි ය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාගේ එකඟත්වය කලින් ලබා නොගෙන, ඒ ලේඛනයෙහි අන්තර්ගත කරුණු අනාවරණය නොකළ යුතු ය.

(3) මේ පනතින් හැර, යම් ලිඛිත නීතියක විධිවිධානවලින් හෝ ඒවා යටතෙහි හෝ එවැනි තැනැත්තකු විසින් එසේ අනාවරණය කිරීම හෝ ඉදිරිපත් කිරීම තහනම් කරනු ලැබූ යම් විස්තරයක් අනාවරණය කිරීම සඳහා හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා මේ වගන්තියෙහි පෙරාතුව සඳහන් විධිවිධාන මගින් යම් තැනැත්තකුට නියම කරනු ලබන බව හෝ අවසර ලැබෙන බව නොසැළකිය යුතු ය.

වාර්තා සැපයීමට අපොහොසත් වන සේවා යෝජකයන්ට අධිභාරයක් පැනවීම.

**33.** මේ පනත ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව යම් දායක මුදලක් සමග වාර්තාවක් සැපයීමට නියමිත යම් සේවා යෝජකයකු නියමිත කාලය ඇතුළත එම වාර්තාව සැපයීමට අපොහොසත් වුවහොත් හෝ සාවද්‍ය හෝ ඌණතා සහිත වාර්තාවක් සපයා ඇති අතර, එම කාලසීමාව සඳහා එම වාර්තාව සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි කරුණු පැහැදිලි කිරීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, නිසි පරිදි සම්පූර්ණ කරන ලද වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබිය යුතු අවසාන දින දක්වා සෑම පූර්ණ මාසයක් හෝ එහි කොටසක් සඳහාම එම දායක මුදලින් සියයට එක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

පරිශ්‍රයක් ආදිය පරීක්ෂා කිරීම සඳහා කොමසාරිස්වරයා සහ අනෙකුත් නිලධයයන් සතු බලතල.

**34.** නියම කළ හැකි කොන්දේසිවලට හා නියමවලට යටත්ව කොමසාරිස්වරයා හෝ ඒ සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු මේ පනතෙහි විධිවිධාන ඉටු කිරීමේ කාර්යය සඳහා—

(අ) යම් සේවානියුක්තකයකුගේ ඉපයීම් සම්බන්ධ යම් ලේඛනයක් හෝ වාර්තාවක් පරීක්ෂා කිරීම සඳහා දහවල් හෝ රාත්‍රියෙහි යුක්ති සහගත යම් වේලාවක යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුලු වී පරීක්ෂා කර බැලිය හැකි ය;

(ආ) එබඳු යම් ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි කොටසක පිටපත් ලබා ගත හැකි ය;

(ඇ) සේවා යෝජකයකු හෝ සේවානියුක්තයකු බව විශ්වාස කිරීමට ඔහුට යුක්ති සහගත හේතු ඇති යම් තැනැත්තකු පරීක්ෂා කළ හැකි ය;

(ඈ) යම් අර්ථ සාධක අරමුදලක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් සම්බන්ධ යම් වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කළ හැකි ය.

සේවා යොජකයන් විසින් වාර්තා තැබීම.

**35.** ආවරණය වන වෘත්තියක සිටින සේවානියුක්තයන්ගේ සෑම සේවා යෝජකයකුම කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබ ගැසට් පත්‍රයේ දැන්වීමක් කරනු ලබන අන්දමේ වාර්තා තබාගත යුතු ය.

වරදවල්.

**36.** (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් උල්ලංඝනය කරනු ලබන;

(ආ) තමාගේ දැනුම අනුව අසත්‍ය හෝ සාවද්‍ය බවට තමන් දන්නා යම් තොරතුරු හෝ එවැනි තොරතුරු ඇතුළත් හෝ එහි යම් කොටසක එවැනි තොරතුරු ඇතුළත් යම් ලේඛනයක් මේ පනතේ කාර්ය සඳහා සපයනු ලබන;

(ඇ) කොමසාරිස්වරයා විසින් හෝ වෙනත් යම් නිලධරයකු විසින් 34 වන වගන්තිය යටතේ තම බලතල ක්‍රියාවෙහි යෙදවීම ඕනෑකමින්ම පමා කරන හෝ අවහිර කරනු ලබන; හෝ

(ඈ) 32 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයක් උල්ලංඝනය කරනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

**වරදවල් සම්බන්ධයෙන් සේවා යෝජකයාගේ කළමණාකරු, නියෝජිතයා යනාදීන්ගේ වගකීම.**

**37.** මේ පනත යටතේ සේවා යෝජකයකු විසින් වගකිව යුතු වරදක් වශයෙන් සළකනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් යම් කළමණාකරුවකු, නියෝජිතයකු, මෙහෙකරුවකු හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලැබූ හෝ සිදු කරනු ලැබූ අවස්ථාවක එම කළමණාකරු, නියෝජිතයා, මෙහෙකරුවා හෝ වෙනත් තැනැත්තා, සේවායෝජකයා මෙන්ම ඔහුට විරුද්ධව වරද සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලැබීමට බැඳී සිටිය යුතු අතර සේවා යෝජකයා සමග හෝ සේවා යෝජකායා වරදකරු කිරීමට පෙර හෝ පසුව සේවායෝජකයා මෙන්ම ඔහු දඬුවම් ලැබීමට ද යටත් විය යුතු ය.

**වෙනත් යම් තැනැත්තකුගේ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වන බව සේවායෝජකයා විසින් ඔප්පු කරන අවස්ථාවක.**

**38.** (1) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් යම් සේවායෝජකයකුට විරුද්ධව චෝදනා කරනු ලැබූ අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියෙහි විධිවිධාන අනුව ඔහු විසින් නිසියාකාරව පැමිණිල්ලක් කිරීමෙන් හා ඔහුගේ අදහස සම්බන්ධව තුන් දිනකට නොඅඩු දැන්වීමක් පැමිණිලි පක්ෂයකට ලබා දීමෙන් ද පසු, එම සංග්‍රහයේ XIV වන අධිකාරයෙහි විධිවිධානවලට යටත්ව, නියම වරදකරු වශයෙන් ඔහු චෝදනා කරනු ලබන වෙනත් යම් තැනැත්තකු අධිකරණය ඉදිරියට ගෙන ඒමට ඔහුට හිමිකමක් තිබිය යුතු ය. ඒ අනෙක් තැනැත්තා විසින් වරද සිදුකළ බව ඔප්පු කරනු ලැබීමෙන් පසු මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා ඔහු නිසි සැළකිල්ලෙන් ක්‍රියා කළ බව ද, ඔහුගේ දැනීම, කැමැත්ත හෝ එකඟවීම නොමැතිව ඒ අනෙක් තැනැත්තා විසින් වරද සිදු කළ බව ද සේවායෝජකයා විසින් අධිකරණය සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරන්නේ නම්, ඒ අනෙක් තැනැත්තා වරද සම්බන්ධයෙන් වරදකරු කළ යුතු අතර, වරද සම්බන්ධ යම් දඬුවමකින් සේවායෝජකයා නිදහස් කළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ යම් අවස්ථාවක, සේවායෝජකයකු විසින් වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබන විට,

(අ) ඒ අනෙක් තැනැත්තාට විරුද්ධ පැමිණිල්ල සේවායෝජකයා විසින් හෝ ඔහු වෙනුවෙන් පවත්වා ගෙන යා යුතු ය ;

(ආ) ඒ අනෙක් තැනැත්තාට එරෙහි නීති කටයුතුවල දී පැමිණිලි පක්ෂය විසින් කැඳවනු ලබන යම් සාක්ෂිකරුවකුගෙන්, කොමසාරිස්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හරස් ප්‍රශ්න ඇසිය හැකි ය ; සහ

(ඇ) ඒ අනෙක් තැනැත්තාට එරෙහි නීති කටයුතු සම්බන්ධව තීරණයක් ලබාදෙන තුරු, සේවා යෝජකයාට එරෙහි නඩුවෙහි නීති කටයුතු කල් තැබිය යුතු ය.

වරදවල් සඳහා දඬුවම්.

**39.** මේ පනත යටතේ වරදකට වරදකරුවකු වන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරුවකු කිරීමෙන් පසු රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර වරදකරු කිරීමේන් පසුව වරද අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයකට නොවැඩි අමතර දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී අයවිය යුතු හිඟ මුදල අයකර ගැනීම.

**40.** (1) මේ පනත යටතේ ගෙවීමට සේවායෝජකයකු යටත් වන යම් මුදලක් ගෙවීම සේවායෝජකයකු විසින් පැහැර හැර ඇත්තා වූ ද, පනතේ 17 වන වගන්තිය යටතේ එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, අරමුදලේ සාමාජිකයා හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් පැහැර හැරීම සිදු කරන ලද හෝ එම පැහර හැරීම සිදු කරන ලද සේවායෝජකයා විසින් සේවයේ යොදවන ලද යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත එම පැහැර හැරීම සිදු කරනු ලබන සේවායෝජකයාගේ නම සහ පදිංචි ස්ථානය හා අයවිය යුතු මුදල පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක් නිකුත් කළ හැකි අතර අධිකරණය විසින් ඊට පසුව පැහැර හැරීම සිදු කරන ලද සේවායෝජකයාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ එසේ අයවිය යුතු මුදල ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය යැයි පිස්කල්වරයා විසින් අදහස් කරනු ලබන එයින් යම් කොටසක් තහනමට ගෙන විකිණීමට හෝ පිස්කල්වරයාට බලය දෙන සහ නියම කෙරෙන ක්‍රියාවේ යෙදවීමේ රීට් ආඥාවක් නිකුත් කරන ලෙස විධාන කළ යුතු ය. එම තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(2) මේ පනත යටතේ ගෙවීමට සේවායෝජකයකු යටත් වන යම් මුදලක් ගෙවීමෙහි ලා එම සේවායෝජකයා විසින් පැහැර හැරීමක් කර ඇත්තා වූ ද, එම මුදල 17 වන වගන්තිය හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අයකර ගැනීම කළ නොහැකි බව හෝ නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක හෝ අයවිය යුතු සම්පූර්ණ මුදල දේපළ තහනමට ගැනීම සහ විකිණීම මගින් අයකර ගෙන නොමැති අවස්ථාවක ඔහු විසින් එසේ අයවිය යුතු මුදල සහ පැහැර හැරීම කරන සේවායෝජකයාගේ නම සහ පදිංචි ස්ථානය ද පිළිබඳ විස්තර අඩංගු සහතිකයක් එම පැහැර හැරීම සිදු කරන ලද්දේ අරමුදලේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් ද එම සාමාජිකයාගේ හෝ සාමාජිකයන්ගේ සේවා ස්ථානය පිහිටි කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත නිකුත් කළ හැකි ය. මහෙස්ත්‍රාත්වරයා එවිට මෙම පනත යටතේ අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු ඔහුට විරුද්ධව නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දින දාහතරක් ඇතුළත ඉදිරිපත් කිරීම සඳහා තමා ඉදිරියට සේවායෝජකයා කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු ඉදිරිපත් නොකළහොත් එම මුදල මහෙස්ත්‍රාත්වරයා විසින් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සඳහා එම සේවා යෝජකයා වෙත දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් ලෙස සළකනු ලැබිය යුතු අතර එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 291 වන වගන්තියේ විධිවිධාන ( (1) වන උපවගන්තියේ (අ), (ඇ) සහ (එ) ඡේද හැර) ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ දණ්ඩන නියමය කරනු ලබන අවස්ථාවේ එම උපවගන්තියේ විධිවිධාන මගින් මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී ප්‍රශ්න කිරීම හෝ අධිකරණයක් විසින් විභාග කිරීම නොකළ යුතු අතර ඒ අනුව මේ වගන්තියෙහි වූ කිසිවකින් එවැනි යම් සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය සළකා බැලීමට හෝ තීරණය කිරීමට අධිකරණයට බලය ලබා නොදිය යුතු ය. කොමසාරිස්වරයාගේ සහතිකය, මේ පනත යටතේ පැහැර හැරීම කරන ලද සේවායෝජකයාගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය නිසි පරිදි ගණනය කරනු ලැබූ බවට ද එම මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර ඇති බවට ද ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(4) මේ පනතේ 17 වන වගන්තියේ කුමක් සඳහන් ව ඇත ද මේ වගන්තියේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

ඔප්පු කිරීමේ භාරය.

**41.** මේ පනත යටතේ යම් සේවා යෝජකයකුගෙන් අයවිය යුතු මුදලක් ගෙවීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් මේ පනතේ 17 වන වගන්තිය යටතේ ඒ සේවායෝජකයාට විරුද්ධ වූ නඩු කටයුත්තක දී, එම මුදල ගෙවූ බව ඔප්පු කිරීමේ භාරය සේවායෝජකයා වෙත පැවැරිය යුතු ය.

මණ්ඩලයක් විසින් කරනු ලබන වරදවල්.

**42.** මේ පනත යටතෙහි වූ වරදක් මණ්ඩලය විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ මණ්ඩලය සංස්ථාගත ආයතනයක් නම්, ඒ සංස්ථාගත ආයතනයේ හැම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකු ද ;

(ආ) ඒ මණ්ඩලය වෙළෙඳ සමාගමක් නම්, ඒ වෙළෙඳ සමාගමෙහි හැම කොටස්කරුවකු ද ;

(ඇ) ඒ මණ්ඩලය වෘත්තීය සංගමයක් නම්, ඒ වෘත්තීය සංගමයෙහි හැම නිලධරයකු ද ;

ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු වශයෙන් සැළකිය යුතු ය.

එසේ වුව ද, තමාගේ දැනීමක් නොමැතිව ඒ වරද කරනු ලැබූ බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා නිසි සැළකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරන්නේ නම් එබඳු සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එබඳු වෙළෙඳ සමාගමක කොටස්කරුවකු හෝ එබඳු වෘත්තීය සංගමයක නිලධරයකු ඒ වරද සම්බන්ධ වරදකරුවකු වශයෙන් නොසැළකිය යුතු ය.

කොමසාරිස්වරයාගේ අනුදැනීම නොමැතිව නඩු නොපැවරීම.

**43.** කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයෙන් හෝ අවසරය ඇතිව මිස, මේ පනත යටතෙහි වරදක් සඳහා කිසිදු නඩුවක් නොපැවරිය යුතු ය.

නියෝග හා ආඥා ආදිය ඔප්පු කිරීම.

**44.** (1) මේ පනත යටතෙහි සාදන ලද යම් නියෝගයක් හෝ ආඥාවක් පළ කරන ලද ගැසට් පත්‍රයෙන් උපුටා ගත් කොටසක් හෝ කොමසාරිස්වරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරනු ලැබූ එවැනි නියෝගයක හෝ ආඥාවක පිටපතක්, ඒ නියෝගය හෝ ආඥාව සත්‍ය බැව් ඔප්පු කිරීම සඳහා අධිකරණයට ඉදිරිපත් කළ හැකි ය.

(2) යම් නීති කටයුත්තක දී—

(අ) සත්‍ය පිටපතක් යයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණකාධිකාරිවරයකු විසින් සහතික කරනු ලැබූ, මේ පනතෙහි කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් තබාගනු ලබන ගිණුම් පොත්වල සටහනක පිටපතක්, හෝ

(ආ) සත්‍ය පිටපත් යයි කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබුවේ යයි අදහස් කෙරෙන, මේ පනතෙහි කාර්ය සඳහා ඔහු විසින් තබාගනු ලබන යම් පොතක හෝ වාර්තාවක හෝ සටහනක පිටපතක්,

ඒ සටහන කරනු ලැබූ බවට හා එහි අන්තර්ගත කරුණු සම්බන්ධව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**45.** (1) මෙම අරමුදලෙහි යම් ආයෝජනයකින් ලැබන ආදායම, ආදායම් බදු අය කිරීමට අදාළ ආදායම් බදු පැනවීම සම්බන්ධ කිසිදු ලිඛිත නීතියක් යටතෙහි අය කළ යුතු ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) මෙම අරමුදල 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප් අරමුදලක් ලෙස සැළකිය යුතු ය.

(3) මේ උපවගන්තියේ "කොමසාරිස්වරයා" සහ "කොමසාරිස් ජනරාල්වරයා" යන්නට 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අර්ථය තිබිය යුතු ය.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම.

**46.** මේ පනතෙහි කාර්යය හා සම්බන්ධව යොදාගනු ලබන යම් ලේඛන සඳහා මුද්දර ගාස්තු අය නොකළ යුතු ය.

මේ පනත යටතෙහි ක්‍රියා කිරීම සම්බන්ධ ආරක්ෂාව.

**47.** මේ පනත හෝ එය යටතෙහි සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ සද්භාවයෙන් සිදු කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකුට විරුද්ධව නඩුවක් හෝ නඩු පැවරීමක් හෝ නීති කෘත්‍යයක් නොපැවරිය යුතු ය.

නියෝග.

**48.** (1) අමාත්‍යවරයා විසින් මේ පනතෙහි කරුණු හා විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සහ මෙම පනත මගින් නියම කළ යුතු යයි බලය පවරා ඇති හා නියම කර ඇති කාරණා හෝ නියෝග සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල සාමාන්‍ය ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත යම් කාරණාවන් හෝ සියලුම කාරණාවන් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනත යටතෙහි දායක මුදල් හා වෙනත් ගෙවීම් එකතු කිරීම හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික සියලු කරුණු සම්බන්ධයෙන් ද ;

(ආ) අරමුදලට වැරදීමකින් ගෙවන ලද යම් මුදලක් ආපසු ගෙවීම සම්බන්ධයෙන් ද ;

(ඇ) දරුවකු වූ හෝ ඒ අවස්ථාවෙහි ක්‍රියා කිරීමට නොහැකි කෙනෙකු වූ ප්‍රතිලාභයකට හිමිකම් කියන්නකුට යම් පනත යටතෙහි පාවිච්චි කිරීමට හිමිකම් ඇති යම් අයිතිවාසිකමක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් කියන්නා වෙනුවෙන් තැනැත්තකු පත් කිරීමට හැකි වීම සඳහා ද, හිමිකම් කියන්නකුට හිමිකමක් ඇති ප්‍රතිලාභයක් භාර ගැනීමට හා ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට එසේ පත් කරන ලද තැනැත්තකුට බලය පැවරීම සඳහා ද ;

(ඈ) සාමාජිකයකු මිය ගිය අවස්ථාවක අරමුදලෙහි ඒ සාමාජිකයාගේ පුද්ගලික ගිණුමෙහි අය පක්ෂයට තිබෙන මුදල ගෙවනු ලැබිය හැකි තැනැත්තකු සම්බන්ධයෙන් ද ;

(ඉ) මේ පනත යටතෙහි සංස්ථාපිත විනිශ්චය සභාවකට අභියාචනා ඉදිරිපත් කළ යුත්තේ කුමන අන්දමකට ද හා කුමන කාලයක් ඇතුළත ද යන්න සම්බන්ධයෙන් ද ;

(ඊ) අභියාචනා සඳහා ඒ විනිශ්චය සභාවට ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් ද ;

(උ) ඒ විනිශ්චය සභාව අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා ක්‍රියාත්මක කළ හැකි බලතල සම්බන්ධයෙන් ද ;

(ඌ) විනිශ්චය සභාවකට ඉදිරිපත් කරන ලද අභියාචනයකට පාර්ශ්වකාරයකු වූ කෙනෙකුට විරුද්ධ ඒ විනිශ්චය සභාව විසින් ගාස්තු ප්‍රදානය කළ හැකි කරුණු හා ඒ ගාස්තු ආපසු අයකර ගැනීමේ අන්දම සම්බන්ධයෙන් ද ;

(එ) (i) මේ පනත යටතෙහි ප්‍රථම අවස්ථාවෙහි හෝ අභියාචනය සම්බන්ධයෙන් යම් ඉල්ලීමක් හෝ ප්‍රතිලාභයක් සම්බන්ධ යම් තැනැත්තකුගේ අයිතිවාසිකම කෙරහි හෝ අරමුදලට දායක මුදල් ගෙවීම සම්බන්ධ යම් තැනැත්තකුගේ බැඳී සිටීම කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයක් නිශ්චය කරන තුරු, හෝ

(ii) එබඳු ඉල්ලීමක හෝ ප්‍රශ්නයක යම් තීරණයක් විනිශ්චය සභාවට අභියාචනය කිරීමේ දී ප්‍රතිශෝධනය කිරීමෙන්,

පැන නගින කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැළැස්වීම සඳහා ද ;

(ඒ) යම් විශ්‍රාම වැටුපක් සඳහා කරන ලද ඉල්ලීමක් සම්බන්ධ තීරණය කොමසාරිස්වරයා විසින් නැවත සලකා බලන තුරු ඒ විශ්‍රාම වැටුප ප්‍රදානය කිරීම අත්හිටුවීම සඳහා ද ;

(ඔ) නොගෙවිය යුතු යයි පසුව තීරණය කරනු ලබන, මේ පනත යටතෙහි කරන ලද යම් තීරණයක් යටතෙහි හෝ යම් නියෝගයක් යම් විධිවිධානයක් ප්‍රකාරව යම් තැනැත්තකුට ගෙවනු ලැබූ යම් මුදලක් නිසියාකාර ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබීම සඳහා හෝ ඔහු විසින් ආපසු ගෙවීම සඳහා ඔහුගෙන් ඒ මුදල ආපසු ලබා ගැනීම සඳහා ද ;

(ඕ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම සඳහා සේවයෙහි යොදවනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්හට දීමනාවන් ගෙවීම හා ඒ දීමනාවන් ගණනය කිරීමේ ක්‍රමය සඳහා ද ;

(ක) මෙම පනතේ කාර්යයන් පාලනය කිරීම සම්බන්ධයෙන් සේවායෝජකයාගෙන් අයකල යුතු ගාස්තු අයකර ගැනීම හා සිදුවන පාඩු කපා හැරීම සඳහා ද ;

(ග) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදවීම හෝ එහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් ද ;

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දින හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් විගස අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ ඉන් පෙර සිදු කරන ලද යම් ක්‍රියාවකට අගතියක් නොවන පරිදි එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැළකිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළකළ යුතු ය.

**49.** මේ පනතෙහි පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය නොවූ විටෙක - අර්ථ නිරූපණය.

"කොමසාරිස්වරයා" යන්නෙන්, කම්කරු කොමසාරිස්වරයා අදහස් වේ.

"ආවරණය වන වෘත්තිය" යන්නෙන්, ආවරණය වන වෘත්තියක් විය යුතු යයි නියෝගයෙන් ප්‍රකාශ කරනු ලැබූ වෘත්තියක් අදහස් වේ.

"සේවානියුක්තයා" යන්නෙන්, සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම ප්‍රකාශිත හෝ ගම්‍යමාන නැතහොත් වාචික හෝ ලිඛිත වූ ද ඒ ගිවිසුම සේවය සම්බන්ධයෙන් හෝ ආධුනිකත්වය සම්බන්ධයෙන් හෝ ගිවිසුමක් වුව ද නැතහොත් ශ්‍රමය සම්බන්ධයෙන් වූ යම් වැඩක් පෞද්ගලිකවම ක්‍රියාත්මක කිරීම් පිණිස වූ ගිවිසුමක් වුව ද කවර වූ යම් තත්වයකින් සේවා යෝජකයකු සමග ගිවිසුමකට ඇතුළත් වූ හෝ ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තකු අදහස් වන අතර යම් තැනැත්තකු යම් විශේෂ අවස්ථාවකදී සේවයෙහි නියුක්ත වුව ද, සේවයෙහි නියුක්ත නොවූව ද එවැනි යම් ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයේ නියුක්ත ඒ තැනැත්තා ද ඇතුළත් වේ.

“සේවා නියුක්තයන්ගේ භාර අරමුදල” යන්නෙන් අදහස් වන්නේ 1980 අංක 46 දරන පනත මගින් පිහිටුවා ඇති අරමුදල වේ ;

“සේවක අර්ථ සාධක අරමුදල” යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත් යටතේ පිහිටුවන ලද අරමුදල අදහස් වේ ;

“සේවායෝජක” යන්නෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර සේවා යෝජක මණ්ඩලයක්, (එම මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෘත්තීය සංගමයක්) සහ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ. තව ද නීත්‍යානුකූල උරුමකරු නීතිය අනුව අනුප්‍රාප්තිකයා, පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු සහ සමාගමක ඈවරකරු ඊට ඇතුළත් වේ. තව ද සංස්ථාගත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ලේකම්වරයා ද හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට එහි කළමනාකාර හවුල්කරු හෝ කළමනාකරු ද ඇතුළත් වේ ;

“ඉපැයීම්” යන්නෙන් -

(අ) වේතන, වැටුප් හෝ ගාස්තු ;

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව හා වෙනත් එවැනි දීමනා ;

(ඇ) නිවාඩු දිනයන් සම්බන්ධ ගෙවීම් ;

(ඈ) අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණය අවසාන තීරණය විය යුතු පරිදි කොමසාරිස්වරයාට අභියාචනයක් කිරීමට යටත්ව සේවා යෝජකයා විසින් වටිනාකම තක්සේරු කරනු ලබන නියමිත වෘත්තිවල සේවකයන්හට සේවා යෝජකයන් විසින් සපයනු ලබන යම් පිසූ ආහාරවල හෝ නොපිසූ ආහාරවල හා එසේ සපයනු ලබන ආහාර සූදානම් කිරීමේදී හෝ පිළියෙළ කිරීමේ දී පාවිච්චි කරනු ලබන එවැනි යම් ද්‍රව්‍යයක මුදලින් වටිනාකම ; හා

(ඉ) ආහාර දීමනාව හා ;

(ඊ) නියම කළ හැකි වෙනත් ක්‍රමවල වැටුප් ;

(උ) අතිකාල, ප්‍රසාද දීමනා හෝ සේවකයා විසින් දරන ලද යම් වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා සිදු කරනු ලබන යම් ගෙවීමක් හැර සේවානියුක්තයකු වෙත ඔහු විසින් සිදුකරන ලද සේවය සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෙනත් යම් ගෙවීමක් ;

අදහස් වේ.

“මුදල් මණ්ඩලය” යන්නෙන් මුදල් නීති පනත යටතෙහි පිහිටුවන ලද මුදල් මණ්ඩලය අදහස් වේ.

වෙනත් ලිඛිත නීතියක් සමඟ සට්ටමනය වන අවස්ථාවක පනත බලපාන බව.

**50.** අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනතෙහි විධිවිධාන බල පැවැත්විය යුතු ය. මේ පනතෙහි විධිවිධාන හා එවැනි වෙනත් නීති අතර සට්ටනයක් හෝ ප්‍රති විරුද්ධත්වයක් ඇති වන යම් අවස්ථාවක මේ පනතෙහි විධිවිධාන බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**51.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.